# මල් සහ විසිතුරු පැල නිපදවන්නට හොඳ කලක්

ශ්‍රී ලංකාවේ මල් සහ විසිතුරු පැලෑටි භාවිතය අනාදිමත් කාලයක සිටම පැවතෙන්නකි. එකල සාමාන්‍ය ජනයාගේ සිට රාජ රාජ මහාමාත්‍යාදීන් දක්වා සෑම තරාතිරමකම ජන කොටස් විවිධ වූ යෝතුන් සඳහා මල් හා විසිතුරු පැල භාවිතා කළ බවට සාක්ෂි පවතී. විශේෂයෙන්, ආගමික හා සංස්කෘතික කටයුතු වල දී මල් වලට සුවිශේෂ ස්ථානයක් ලබා දී තිබුණි. මේ නිසා, මල් සහ විසිතුරු පැල වගාව කුඩා ග්‍රාමීය ගෙවත්තක සිට රාජ මාලිග වල උයන් වතු දක්වාම ව්‍යාප්තව පැවතුන බවට ලිඛිත තොරතුරු පවතී. මෙම තත්ත්වය මෑත කාලීනව පවා එලෙසම පවතින අතර පසුගිය දශක දෙකක පමණ කලක සිට මල් සහ විසිතුරු පැල වගාව සාමාන්‍ය සාම්ප්‍රදායික භාවිතයෙන් තරමක් ඉදිරියට ගොස් ආදායම් ඉපැයීමේ සහ රටට විදේශ විනිමය උපයන මාර්ගයක් ලෙස සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. මෑත කාලීන පර්යේෂණ වාර්තා වලට අනුව, මෙරට තරුණ පරපුර ක්‍රමයෙන් කෘෂි කර්මාන්තයෙන් ඉවත් වෙමින් යන කාලවකවානුවක මල් සහ විසිතුරු පැල වගාව, ආර්ථික වශයෙන් වැදගත් වාණිජ වගාවක් බවට පත් වෙමින් පැවතීම නිසා නැවතත් තරුණ පරපුර මල් හා විසිතුරු පැල ආශ්‍රිත කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයට නැඹුරුවීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබේ. වර්තමානයේ මෙම කර්මාන්තයේ නියැලී සිටින බහුතරය රැකියා විරහිත උගත් තරුණ තරුණියෝය.

### මල් හා විසිතුරු පැල වගාවේ වැදගත්කම

මෑත කාලීනව විදේශ වෙළඳපොළට අවශ්‍ය මල් හා විසිතුරු පැල සපයන රටවල් අතරින් ශ්‍රී ලංකාවට ද සැලකිය යුතු ස්ථානයක් හිමිව තිබේ. ලෝක වෙළඳපොළට ශ්‍රී ලංකාවෙන් සපයන මල් හා විසිතුරු පැල ප්‍රමාණය, ලෝක වෙළඳපොළේ ඉල්ලුමෙන් 1% කට ආසන්න ප්‍රමාණයක් වුවත් ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට සැලකිය යුතු ප්‍රමාණයකි. පසුගිය වසර කිහිපයක මල් සහ විසිතුරු පැල අපනයන ආදායම සම්බන්ධ විමසා බැලූ විට එහි වැදගත්කම අවබෝධ කර ගත හැකි වේ.

**මල් සහ විසිතුරු පැල අපනයනය (ඇමරිකානු ඩොලර් මිලියන)**

| වසර | 1996 | 1997 | 1998 | 1999 | 2000 | 2001 | 2002 |
|---|---|---|---|---|---|---|---|
| වටිනාකම | 8.21 | 8.22 | 7.57 | 8.12 | 8.24 | 8.09 | 8.11 |

මූලය – අපනයන සංවර්ධන මණ්ඩලය – 2003.

මෙම සංඛ්‍යා වලට අනුව 1996 සිට 2002 දක්වා කාලය තුළ මල් සහ විසිතුරු පැල අපනයනය කිරීමෙන් සෑම වසරකම ඇමරිකානු ඩොලර් මිලියන 08 ක පමණ විදේශ විනිමයක් රටට ලැබී තිබේ.

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කරන රටක් වුව ද, මල් සහ විසිතුරු පැල අපනයනය සම්බන්ධයෙන් ඇත්තේ ඉතා කෙටි ඉතිහාසයකි. මෙම කෙටි කාලය තුළ වුවත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විශේෂ අවධානය මෙම අංශය කෙරෙහි යොමු වෙමින් පවතින බැවින් ඉදිරියේදී මෙම ක්ෂේත්‍රයේ වේගවත් සංවර්ධනයක් කළ හැකි වන බව පැහැදිලි කරුණකි.

පසුගිය වසර 10 ක පමණ කාල පරාසයක මල් හා විසිතුරු පැල අපනයනය පිළිබඳ විමසන විට දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ අනෙකුත් සාම්ප්‍රදායික කෘෂි නිෂ්පාදන වලට සාපේක්ෂව මල් හා විසිතුරු පැල අපනයනයේ සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබෙන බවකි. මෑත කාලීනව මල් හා විසිතුරු පැල වේගයෙන් ව්‍යාප්ත වන කර්මාන්තයක් වන අතර මල් හා විසිතුරු පැල ආශ්‍රිත නිෂ්පාදනවල උසස් බව සහ ගුණාත්මක බව සාපේක්ෂව ඉතාමත් ඉහළ මට්ටමකට ගෙනැවිත් තිබේ. මෙම තත්ත්වය මත ලෝකයේ හොඳම මල් සහ විසිතුරු පැල නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට විශේෂ ස්ථානයක් හිමි වේ. ඉතාමත් හොඳ තත්ත්වයේ නිෂ්පාදන කලට වේලාවට සැපයීම තුළින් ලෝක වෙළඳපොළේ ශ්‍රී ලංකාවේ මල් සහ විසිතුරු පැල සඳහා හොඳ ඉල්ලුමක් පවතී.

ලෝකයේ සෙසු සංවර්ධනය වන රටවල් හා සන්සන්දනය කර බලන විට, විශේෂයෙන් මල් හා විසිතුරු පැල නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි රැසක් ශ්‍රී ලංකාවට හිමි වේ. එනම්, මෙම වගාවන්ට ඉතාමත් සුදුසු ඉඩම්, දේශගුණය හා ප්‍රමාණවත් තරම් ශ්‍රමය ලබා ගත හැකිවීම එක් විශේෂ ලක්ෂණයකි.

### මල් සහ විසිතුරු පැල වගාව

මෑත කාලීනව ශ්‍රී ලංකාවේ මල් හා විසිතුරු පැල වගාව ව්‍යාපාරික වශයෙන් විශාල ලෙස ව්‍යාප්ත වීමක් දැකිය හැකිය. අනෙකුත් වගාවන්ට සාපේක්ෂව මල් වගාව සඳහා නව තාක්ෂණය බහුලව භාවිතා කළ යුතු අතර ඒ සඳහා යන වියදම ද සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පවතී. මෙහි දී ආදායම ගතහොත් ඒකක මට්ටමෙන් අනෙකුත් කෘෂි නිෂ්පාදන වලට වඩා ඉතා ඉහළ මට්ටමක පවතී.

**ආචාර්ය එම්.එස්. සේනානායක**
*අංශ ප්‍රධාන*
**කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය,**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

දැනට ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික වශයෙන් අපනයනය කිරීම සඳහා මල් සහ විසිතුරු පැල අක්කර 500 ක පමණ වගා කරනු ලබන බව ඇස්තමේන්තු කර තිබේ. මේ අතුරෙන් 50% ක් පමණ ආවරණ දැල් සහිත නව තාක්ෂණ ක්‍රම භාවිතා කර වගා කරනු ලබයි. මෙමඟින් දළ වශයෙන් ශ්‍රමිකයන් 4000 කට පමණ සෘජු හා වක්‍ර ලෙස රැකියා ලැබී ඇති අතර ඉදිරියේ දී මේ තත්ත්වය තවදුරටත් වර්ධනය කිරීමේ හැකියාව පවතී. මෙම ක්ෂේත්‍රයේ ආයෝජනය කර ඇති අය අතර විදේශ ආයෝජකයන් ද සිටී. මෙහි දී, ඔවුන්ට මෙම ව්‍යාපාරය කර ගෙන යාම සඳහා අවශ්‍ය කෙරෙන පහසුකම් සපයා තිබේ. මේ නිසා, විදේශීය තාක්ෂණය හා කළමනාකරණ හැකියාවන් පහසුවෙන් ලබා ගැනීමට හැකි වී ඇත. විශේෂයෙන් ජාත්‍යන්තර වෙළඳපොළට මල් සහ විසිතුරු පැල නිෂ්පාදනය කරන විට, ඒ සඳහා ඉතා ඉහළ කළමනාකරණ හැකියාවක් හා නව තාක්ෂණය යෙදවීමේ හැකියාවක් පැවතිය යුතුය. එසේ නොවුනහොත් විදේශ වෙළඳපොළේ සෙසු රටවල් සමඟ තරඟ කිරීමේ හැකියාව අඩු වේ.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂි බෝග වගාවට වැඩි නැඹුරුවක් නොමැති අවධියක මල් හා විසිතුරු පැල කෂේත්‍රයේ මෙවන් වර්ධනයක් ඇතිවීම දේශීය කෘෂි ක්ෂේත්‍රයේ නව පිබිදීමක් ලෙස හඳුන්වා දිය හැකිය. ග්‍රාමීය වශයෙන් විශාල පිරිසකට රැකියා ලබාදීමේ මාධ්‍යයක් ලෙස මෙය භාවිතා කිරීමේ හැකියාවක් පවතී. එමෙන්ම, මේ ආශ්‍රිත සෙසු සේවාවන් විශේෂයෙන් මල් පෝච්චි, කාබනික පොහොර (ගොම) සැපයීම, කොහුබත් ප්‍රවාහන කටයුතු යනාදිය නිසා තවදුරටත් ආර්ථික වශයෙන් මෙම කර්මාන්තය වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ මල් හා විසිතුරු පැල නිෂ්පාදකයන් ප්‍රධාන කොටස් තුනක් යටතේ වර්ග කළ හැකිය. එනම්, ව්‍යාපාරික වශයෙන් අපනයනය කිරීම සඳහා නිෂ්පාදනය කරන මහා පරිමාන වගාකරුවන්, දේශීය වෙළඳපොළට හා විදේශීය අපනයනකරුවන්ට සැපයීම සඳහා නිෂ්පාදනය කරනු ලබන මධ්‍ය පරිමාන නිෂ්පාදකයන් සහ ග්‍රාමීය මට්ටමේ තම ගෙවතුවල සුළු වශයෙන් නිෂ්පාදනය කරන සුළු පරිමාන නිෂ්පාදකයන් වශයෙනි. අපනයනය සඳහා නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයින් ප්‍රධාන නගර කේන්ද්‍ර කොට ගෙන නිෂ්පාදන කටයුතු කරනු ලබන අතර නව තාක්ෂණය බහුල ලෙස යොදා ගනී. සුළු හා මධ්‍ය පරිමානයේ නිෂ්පාදකයන් අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල තම නිෂ්පාදන දේශීය හා සාම්ප්‍රදායික ක්‍රම භාවිතා කරමින් සිදු කරනු ලබයි. විශේෂයෙන්, ශ්‍රී ලංකාවේ කොළඹ, ගම්පහ, කුරුණෑගල, නුවර, නුවරඑළිය, කෑගල්ල හා බදුල්ල යන දිස්ත්‍රික්කවල මෙම කර්මාන්තය ප්‍රධාන වශයෙන් පවතී. මේ සඳහා අනෙකුත් කෘෂි බෝගයන්ට සාපේක්ෂව, කෘෂි ව්‍යාප්ති සේවාවන් හෝ අනෙකුත් පහසුකම් සැපයීමක් සිදු නොවන අතර එම නිෂ්පාදකයින් තමන්ගේ පෞද්ගලික මාර්ග වලින් මෙම සේවාවන් සපයා ගනී. ලියාපදිංචි වී ඇති මල් සමිති හා සම්බන්ධ ඉතාමත් සුළු නිෂ්පාදකයින් පිරිසකට අපනයන සංවර්ධන මණ්ඩලය මඟින් වෙළඳපොළවල් සොයාදීම හා සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු ලබාදීමක් සිදු කරයි.

වර්තමානයේ සුළු හා මධ්‍ය පරිමාන මල් හා විසිතුරු පැල වගාකරුවන් තමන්ගේම ඉඩම්වල තම ශ්‍රමය හා අරමුදල් භාවිතා කරමින් මෙම ව්‍යාපාරයේ නියුක්ත වේ. මේ සඳහා අවශ්‍ය උපදේශක සේවාවන් හෝ පුහුණු පාඨමාලා තවමත් එතරම් සාර්ථක මට්ටමක නොපවතින අතර නිෂ්පාදකයින්ගේ අවශ්‍යතාව මත, අවශ්‍ය උපදෙස් හා තොරතුරු හිතවතුන්ගෙන් සහ සමහර මල් සමිති මාර්ගයෙන් ලබා ගනී. රාජ්‍ය මට්ටමෙන් මේ සඳහා දිරි දීමට ව්‍යාප්ති සේවාවක් තවමත් නොපවතින අතර එය මෙම කර්මාන්තයයේ දියුණුවට විශාල බාධකයක් වී තිබේ. සමහර සුළු පරිමාන ග්‍රාමීය මට්ටමේ මල් හා විසිතුරු පැල නිෂ්පාදකයන්ට ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට නිශ්චිත ස්ථානයක් නොමැති අතර ඒ සඳහා ඔවුන්ගෙන් බහුතරයක් තෝරා ගෙන ඇත්තේ මල් නිෂ්පාදකයිගේ සමිති මාර්ගයෙන් කොළඹ විහාරමහා දේවී උද්‍යානයේ පවත්වන මල් ප්‍රදර්ශනයන් ය. මෙහි දී ඔවුන්ට ආවේනික අරමුණු කරා ළඟා වීමට නොහැකි වී තිබේ. එනම් ප්‍රවාහන ගාස්තු, මල් සමිතිවල සාමාජික ගාස්තු, ප්‍රදර්ශනවලට ඇතුළත්වීමේ ගාස්තු යනා දී වශයෙන් විවිධ ගෙවීම් කිරීමට සිදුවීම නිසා තම නිෂ්පාදන වලට නිශ්චිත ලාභයක් ලබා ගත නොහැකි නිසාවෙනි. තවත් සමහර සුළු පරිමාන වගාකරුවන් තම නිවසේ හෝ පාර දෙපස හිතවත් අයගේ නිවෙස්වල ප්‍රදර්ශනයට තබා, තම මල් හා පැල වර්ග අලෙවි කරනු ලබයි. මේ නිසා, මල් හා විසිතුරු පැල නිෂ්පාදකයන් සම්බන්ධයෙන් නිශ්චිත වෙළඳපොළක් සහ තම නිෂ්පාදන පහසුවෙන් අලෙවි කර ගැනීමට හැකි ස්ථාන හඳුන්වා දීමට කටයුතු කළ හැකි නම් මෙම ක්ෂේත්‍රයේ සීඝ්‍ර වර්ධනයක් ඇති කළ හැකිය. විශේෂයෙන්, නාගරික කුඩා නිවාසවල ජීවත් වන බහුතරයක් වන ජනතාවට මල් ගසක් වවා ගැනීමට වත් ඉඩ පහසුකමක් නොමැති අතර ඒ නිසා ඔවුහු වෙළඳපොළෙන් මල් පැල, මල් පෝච්චි මිල දී ගෙන තම නිවාස අලංකාර කර ගැනීමට උත්සාහ දරති. එමනිසා, මෙම කර්මාන්තයට ඉතා හොඳ අනාගතයක් පවතින බව පැහැදිලිවම කිව හැකිය.

අනෙකුත් සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත වලට සාපේක්ෂව බලන කල සුළු පරිමානයෙන් මල් හා විසිතුරු පැල කර්මාන්තය ඉතා අඩු ප්‍රාග්ධනයක් හා අඩු ශ්‍රමයකින් ආරම්භ කළ හැකි කර්මාන්තයක් බැවින් රැකියා විරහිත ඕනෑම අයෙකුට මෙම කර්මාන්තයට ඇතුළු වීමේ හැකියාව පවතී. එමනිසා, මෙම කර්මාන්තය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම අවශ්‍ය වන අතර කැමති අයට මෙම කර්මාන්තය කර ගෙන යාම සඳහා අවශ්‍ය මූලික සහයෝගය ලබාදීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමේ අවශ්‍යතාව පැන නැගී තිබේ. කෙසේ වෙතත්, වර්තමාන මල් හා විසිතුරුපැල වෙළඳපොළ දෙස විමර්ෂණාත්මකව බැලූ විට පෙනී යන විශේෂ කරුණක් වන්නේ ඕනෑම ශාකයක් අලංකාර හා පිළිවෙලකට සකස් කර වගා කළ හැකි නම් අලෙවිය ගැටළුවක් නොවන බවයි. මේ සඳහා විශේෂ පැළෑටි හෝ මල් වර්ග පමණක් වගා කිරීමක් අවශ්‍ය නොවේ. එබැවින්, මෙම අවස්ථාවෙන්

ප්‍රයෝජන ගැනීමට කාගේත් අවධානය යොමු විය යුතු වේ.

ශ්‍රී ලංකාවේ මල් සහ විසිතුරු පැල නිෂ්පාදන කර්මාන්තය පහසුවෙන් ව්‍යාප්ත කළ හැකි කර්මාන්තයක් වුවත් එය එසේ ව්‍යාප්ත නොවීමට බලපෑ හේතු රැසක් ඇති බව සම්පව සිදු කළ නිරීක්ෂණ වල දී හෙළි විය. මෙයින් ප්‍රධාන ස්ථානයක් ගනු ලබන්නේ මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීමේ අපහසුවයි. සුළු, මධ්‍ය හා මහා පරිමාන යන සියළුම නිෂ්පාදකයින්ට මෙම ගැටළුව එකම ආකාරයෙන් බලපාන බව පැහැදිලිය. නව පැලෑටි බීජ හා රෝපන ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති අපහසුව ද තවත් ප්‍රධාන ගැටළුවකි. ලෝක වෙළඳපොළේ කලින් කලට වෙනස්වන ඉල්ලුමක් පවතින අතර නව මල් වර්ග හා පැලෑටි වර්ග වලට විශේෂ නැඹුරුවක් පවතී. ශ්‍රී ලංකාවේ වගාකරුවන්ට මෙම නව මල් හා පැලෑටි කලට වේලාවට ලබා ගැනීමේ අපහසුතාවක් පවතින අතර ණය හා අරමුදල් සපයා ගැනීමේ ගැටළුව, නව තාක්ෂණ දැනුම ලබා ගැනීමේ අපහසුව, ගුවන් ප්‍රවාහන වියදම් අධිකවීම යනා දී ප්‍රධාන ගැටළු රැසක් නිසා ගොවීන්ට තම කර්මාන්තය අපනයන තත්ත්වය දියුණු කිරීමට නොහැකිවී තිබේ. මෙම ගැටළු සඳහා රාජ්‍ය හෝ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මට්ටමෙන් ලංකාවේ මල් හා විසිතුරු පැල වගාකරුවන්ට යම් සහනයක් සැලසිය හැකි නම් එය මෙම කර්මාන්තය දියුණු කිරීම සඳහා මහත් පිටුවහලක් වනු නොඅනුමානය.

## වර්ණ සකසා ගැනීමට ආදි කාලයේ භාවිතයට ගත් ශාක විශේෂ කිහිපයක්.........

**පැරැන්නෝ ගහ - කොළට ආදරය කළහ. ඔවුහු සිය දෛනික කර්තව්‍යයන් හි දී, ගහ - කොළ සමග මනා බැඳීමකින් කටයුතු කළෝය. විවිධ කලා කටයුතු වල දී වර්ණ ගැන්වීමට නැතිනම් වර්ණ සකසා ගැනීමට ඔවුනටම සුවිශේෂී, දැන හඳුනාගත් ක්‍රම ශිල්පයන් මෙන්ම රට යොදා ගැනීමට සුදුසු ශාකයන් තිබුණි. පහත සටහන් වන්නේ එවන් වූ ශාක විශේෂ කිහිපයක කිසියම් වූ කොටසක් භාවිතා කරමින් සකසා ගත් වර්ණයන් පිළිබඳ සටහනකි.**

| ශාකය | උද්භිද විද්‍යාත්මක නාමය | ලබාගත හැකි වර්ණය |
|---|---|---|
| සේපාලිකා | *Indigofera tinctaria* | නිල්/කොළ |
| නෙල්ලි | *Phyllanthus embelica* | කොළ |
| කොස් | *Artocarpus heterophyllus* | කහ/ඇන් දළ පාට |
| අරළු | *Terminalia chebula* | කළු/අළු පාට |
| පුවක් | *Arecacatechu* | දුඹුරු/රෝස |
| පොල් | *Cocos nucifere* | දුඹුරු |
| අරලියා | *Plumeria rubra* | ලා ඔලිව් දළු පැහැය |
| යුකැලිප්ටස් | *Eucalyptus spp* | රතුන් පැහැය |
| කැසුරිනා | *Casuarina equestifolia* | තද රෝස |
| හොර | *Diperocarpus zeylanicus* | ලා අළු පාට |

**(පොත - පත ඇසුරෙනි.)**

**සකස් කලේ : නාලක විජේසූරිය**